Sannasa Sports

# අයි පී එල් ධන නිධානය

මේ දිනවල අයිපීඑල් තරගාවලිය ඉතා සාර්ථකව දකුණු අප්‍රිකාවේදී පැවැත්වෙයි. පසු-ගිය වසරේ දී ඉන්දියාවේ උපත ලද මෙම ලීග් තරගාවලිය (ඉන්දියන් ප්‍රිමියර් ලීග්) දකුණු ආසියාකරයේ ඇතිවූ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් නිසා අඩපන වී ආරක්ෂක හේතු මත උපන් ගෙයිම් මියයන සේයාවක් පෙනෙන්නට තිබුණි. එහෙත් ඉතා සැළසුම් සහගත ලෙස සියලුම අභියෝගයනට මුහුණ දිය හැකි අයුරින් සංවිධානය කර තිබූ මේ තරගාවලියද කුණු අප්‍රිකාවේ පැවැත්වීමට කටයුතු කිරීම තරගාවලියේ ප්‍රබල බව ලෝකයටම කියාපාන්නකි.

දැනට ලෝකයේ පැවැත්වෙන විශාල ක්‍රිකට් තරගාවලිය ලෝක කුසලානය වුව ද වැඩිම ධන සම්භාරයක් පරිහරනය වන්නේ මේ තරගාවලිය තුළය. ලොව වටා විහිදී සිටින වෘත්තිය මට්ටමේ ක්‍රිකට් ක්‍රීඩකයන්ට ධන උල්පතක් වන මෙම තරගාවලියේදී සිදුවන්නේ ක්‍රීඩකයන්ගේ දක්ෂකම් හා ජනප්‍රියත්වය මත වෙන්දේසියකින් වටිනාකමක් ලබාදීමයි. මේ වෙන්දේසියේ දී ක්‍රිඩකයන් ලබා ගැනීමට තරග වදින්නේ ඉන්දියානු ක්‍රීඩා සමාජ අටකි. ක්‍රීඩා සමාජ ලෙස හැඳින්වුවද ඇත්ත වශයෙන්ම නම් මේවා ධනකුවේරයන්ගේ පෞද්ගලික සමාගම් ලෙස හැඳින්වීම වඩා නිවැරදි ය.

කෙසේ වෙතත් මෙම සමාජ මගින් ඔවුන්ගේ අවශ්‍යතාව පරිදි සමහර ක්‍රීඩකයන් ඇමරිකන් ඩොලර් මිලියන ගණන් ලබා දී තම ක්‍රීඩා සමාජයට බඳවා ගැනීම දක්නට ලැබුණේ ඉතිහාසයේ පළමු වතාවට ය.

තරගාවලිය පැවැත්වෙන සති 6 කට ආසන්න කෙටි කාලය තුළ ඕනෑම ක්‍රීඩකයකුට තම රට නියෝජනය කරන තරග සඳහා නිදහස් කර යැවීමටද මෙම සමාජ බැඳී සිටියි.





**දැනට දකුණු අප්‍රිකාවේ පැවැත්වෙන මෙම තරගාවලිය ආරක්ෂක හේතු මත එම රටට ගෙන යාම අහම්බයකින් මෙන් සිදු වුව ද ක්‍රීඩා ලෝලීන්ගෙන් අතුරු සිදුරු නැතිව පිරී ඉතිරී යන ක්‍රීඩාංගන නිසා මෙය අයිපීඑල් තරගාවලියේ තවත් එක් ඉදිරි පියවරක් බව ක්‍රීඩා විචාරකයන්ගේ මතයයි. ඒ අනුව ලෝක කුසලාන තරගාවලිය මෙන් මේ තරගාවලියද ලොව වටා ගෙන යා යුතු බවට දැනටමත් සංවිධායකයන් තීරණය කර ඇති බවක් ද අසන්නට ලැබුණි.**

දැනට දකුණු අප්‍රිකාවේ පැවැත්වෙන මෙම තරගාවලිය ආරක්ෂක හේතු මත එම රටට ගෙන යාම අහම්බයකින් මෙන් සිදු වුව ද ක්‍රීඩා ලෝලීන්ගෙන් අතුරු සිදුරු නැතිව පිරී ඉතිරී යන ක්‍රීඩාංගන නිසා මෙය අයිපීඑල් තරගාවලියේ තවත් එක් ඉදිරි පියවරක් බව ක්‍රීඩා විචාරකයන්ගේ මතයයි. ඒ අනුව ලෝක කුසලාන තරගාවලිය මෙන් මේ තරගාවලියද ලොව වටා ගෙන යා යුතු බවට දැනටමත් සංවිධායකයන් තීරණය කර ඇති බවක් ද අසන්නට ලැබුණි.

දැනට මෙම තරගාවලියට සහභාගි වන ශ්‍රී ලාංකික ක්‍රිඩකයන් අතුරින් තිලකරත්න ඩිල්ෂාන් කුමාර සංගක්කාර මහේල ජයවර්ධන හා ලසිත් මාලිංග කැපී පෙනෙන දස්කම් පෙන්වා ඇත . ඔස්ට්‍රේලියා ක්‍රිකට් ක්‍රීඩාවෙන් සමුගත් මැතිව් හේඩ්න් වැනි ක්‍රිඩකයන් ද තරගාවලියේ ඉහළම දස්කම් පෙන්වන්නට සමත්වීම කැපී පෙනෙයි.

මේ තරගාවලියේ අතුරු ඵලයක් ලෙස අවුරුදු 18 වැනි අඩු වයස් වල සිටින නවක ඉන්දීය ක්‍රිකට් ක්‍රීඩකයන් අසීමිත දස්කම් ලබමින් ඉදිරිය ඒම ඉන්දියාව ලබන විශාල වාසියකි.

ට්වෙන්ටි 20 වැනි ක්‍රිකට් ක්‍රීඩාවේ නව ප්‍රවනතා ලොව ධනවත්ම ක්‍රීඩකයන් බිහි කරන පාපන්දු වැනි ක්‍රීඩා අතරට ඇදී යාම ක්‍රිකට් ක්‍රීඩාවේ අනගතය පිළිබඳ සුබ පෙරනිමිත්තක් යයි අපට සිතෙයි.

**අසෝක සිල්වා**

---

3 වන පිටුවෙන් (ත්‍රස්තවාදය නිසා )

වී දුම්රියෙන් මදුරාසියට ළඟා වන්නේ පසුදා අලුයමය. මදුරාසියේ සිට ඔවුන් ගමන් ගන්නේ විශේෂ දුම්රිය මැදිරියකය.

ගෝදවාරී හා ක්‍රිෂ්ණා යන මහා ගංගාවන් තරණය කොට පැය 36 කට පසු කල්කටාවට පිවිසෙන වන්දනාකරුවෝ ධර්මරාජිත විහාරයේ ලැගුම් ගෙන, ඊට පසු දින බුද්ධගයාව බලා පිටත් වෙති. බුද්ධගයා, රජගහ, ඉසිපතන, ලුම්බිණි, කුසිනාරා හා සැවැත්නුවරද වැඳ පුදා ගන්නා වන්දනාකරුවන් පෙරළා පැමිණෙන්නේ දිල්ලිය හරහාය.

ධර්මපාලතුමාගේ කාලයේ සිට අවුරුදු 30කට වැඩි කාලයක් මේ වන්දනා නඩයේ 'නඩේ ගුරා' වුයේ කරුණාරත්න නම් මහතෙකි. කොණ්ඩය බැඳි කෙසඟී සිරුරක් ඇති කරුණාරත්න මහතා සිංහල පමණක් නොව ඉංග්‍රීසි දෙමළ හා හින්දි භාෂා ද හසුරුවන්නට දැන සිටියේය. ඒ නිසා මේ දුෂ්කර කාර්ය ඔහුට එතරම් අපහසු කර්තව්‍යයක් නොවීය.

ක්‍රමයෙන් තවත් වන්දන නඩ බිහිවන්නට විය. ඒවා බොහොමයක් වාණිජමය පදනමකින් සංවිධානය කර තිබුණි.

පැරණි වන්දනා චාරිකාවට පනහ දසකයේ අලුතින් එකතු වුයේ මධ්‍යම ඉන්දියාවේ සාංචිය හා බටහිර ඉන්දියාවේ අජන්තා ඇල්ලෝරා ගුහාය. මේ නිසා වන්දනා චාරිකාවට බොම්බායේ සාප්පු සවාරියක්ද ඇතුළත් විය. කෙසේ වුවද වන්දනාව දිගටම කෙරුණේ දුම්රියෙනි.

බුද්ධ ජයන්ති වර්ෂය ඇරුඹෙත් ම දනුෂ්කොඩිය සුනාමියකට ගොදුරු වී විනාශ වී ගියේය. එහෙත් ඉන්දියානු රජය නැව් සේවය තලෙයිමන්නාරමේ සිට රාමේෂ්වරම් දක්වා ප්‍රතිව්‍යුහගත කළේය.

බුද්ධ ජයන්ති වර්ෂයේ දී (1956-57) වෙනදා මෙන් තුන්ගුණයක් දඹදිවට පැමිණි බව වාර්තා වෙයි.

සොළොස්මස්ථානය වැඳ පුදා ගන්නට යන වන්දනාගමනක මෙන් නිවී සැනසිල්ලේ දුම්රිය මැදිරි තුළ උයා පියා ගෙන ඉමහත් ශ්‍රද්ධාවෙන් වන්දනාකරුවන් ගිය ගමන ක්‍රමයෙන් කෙටි වන්නට පටන් ගත්තේය. එසේ වුයේ ගුවන් සේවා තරග ඇරඹීමත් සමඟය. කොළඹ සිට තලෙයිමන්නාරම හරහා මදුරාසියට යාමට පැය 36 ක් ගත වීය. රත්මලානේ සිට මීනම්බක්කම් ගුවන් තොටුපළට ප්‍රවේශ වීමට ගතවන්නේ පැයකුත් මිනිත්තු ගණනකි.

වන්දනාකරුවන්ගෙන් කොටසක් මේ කෙටි කාලීන චාරිකාවට එක් වුවද බහුතරය දිගටම ගමන් ගත්තේ දුම්රිය මාර්ගයෙනි. බොහෝ දෙනා එසේ කළේ එය ශ්‍රද්ධා භක්තිය වැඩි කරන අතරම විනෝද ජනක වන්දනා ගමනක් වු නිසාය.

මේ විස්මය ජනක සැදැහැවත් චාරිකාවට කණ කොකා හඬන්නට පටන් ගැනුණේ 1985න් පසුවය. උතුරේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය අවසන් කරමින් ප්‍රභාකරන් නමැති ත්‍රස්තවාදී නායකයා දෙමළ ජනතාවගේ විමුක්ති සටන කොල්ලකා ගැනීම සමඟම ඔහු මුලින්ම විනාශ කර දැම්මෙ මුළු උතුරු පළාත පුරා විහිදී ගිය දුම්රිය මාර්ග යි. වවුනියාවේ සිට කන්කසන්තුරේ දක්වාත් මඩුරෝඩ් සිට තලෙයිමන්නාරම දක්වාත් තිබු සෑම රේල් පීල්ලක්ම, සෑම සිල්පර කොටයක්ම ත්‍රස්තවදීන්ගේ බංකර සැදීමට මහෝපකාරී විය. අදත් ඔවුන් අන්තිම සටන ගෙන යන්නේ ඒ බංකර් තුළ සිටය.

දැන් අපි වන්දනාකරුවන් දෙසට හැරෙමු. තවමත් සැලකිය යුතු සංඛ්‍යාවක් වෙන්නායි බලා ගුවනින් ගොස් එතැන් සිට පැරැණි වන්දනා චාරිකාවේ ම යෙදෙති. එහෙත් වැඩි දෙනා දැන් තෝරා ගන්නේ සුඛෝපභෝගී කෙටි ගුවන් චාරිකාය. දැන් සැදැහැවත් වන්දනාකරුවන්ට පවා 'දඹදිව' සඳහා කාලය වෙන්කර ගැනීම ඉතාම දුෂ්කරය. කාර්ය බහුල ඔවුනට දවසේ පැය 24 කට වැඩ රාජකාරි සඳහා ප්‍රමාණවත් නොවී තිබේ. කනගාටුව නම් එපමණ කාර්ය බහුල ජාතියටත් දළ දේශීය නිෂ්පාදනයේ ලෝවාමහාපායේ ගල්කණු මෙන් නොසෙල් වී එතැනම සිටීමට සිදුවීමය.

අතීත වන්දනාගමන් පිළිබඳ මේ සුන්දර කතාව මෙසේ ඉදිරිපත් කරන්නේ වර්තමාන පරපුරේ හුදී ජනතාවගේ ප්‍රසාද සංවේගය සඳහාය.

[redacted]